සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2023-08-26
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) ***ප්‍රස්තාර කොළ** සපයනු ලැබේ.*
  (7) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (8) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකත්වය සඳහා වන ප්‍රතිලාභය කුමක් ද?

(1) පොලිය. (2) කුලිය. (3) ලාභය. (4) වේතන.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, උපේක්ෂා වක්‍රය (indifference curve) සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) උපේක්ෂා වක්‍ර දෙකක් එකිනෙක ඡේදනය වේ.
(2) එය දකුණේ සිට වමට ඉහළට බෑවුම් වේ.
(3) එය පුද්ගලයෙකුට සමාන තෘප්තියක් ලබාදෙන භාණ්ඩ දෙකක වෙනස් සංයෝජනයකි.
(4) එය භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිතතාවය හඳුනාගැනීමට භාවිත කරයි.

**1.3** A සහ B භාණ්ඩ අතර හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන වේ නම්, එම භාණ්ඩ:

(1) ආදේශක භාණ්ඩ වේ. (2) සාමාන්‍ය භාණ්ඩ වේ.
(3) අනුපූරක භාණ්ඩ වේ. (4) බාල භාණ්ඩ වේ.

**1.4** **X** භාණ්ඩයේ මිල රු.100/- සිට රු.120/- දක්වා වැඩිවන විට, එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය ඒකක 1,000 සිට 1,100 දක්වා ඉහළ යයි. මෙහි සැපයුමේ මිල නම්‍යතාවයේ ස්වභාවය:

(1) නම්‍ය වේ. (2) අනම්‍ය වේ. (3) ඒකීය නම්‍ය වේ. (4) පූර්ණ අනම්‍ය වේ.

**1.5** 2022 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතය වූයේ:

(1) 2.3%. (2) 1.5%. (3) -4.6%. (4) -7.8%.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික වර්ධනයේ සෘණාත්මක බලපෑමක් සඳහා අවස්ථාවක් වන්නේ කුමක් ද?

(1) සේවා නියුක්ත අනුපාතය ඉහළ යාම. (2) ආයෝජන ඉහළ යාම.

(3) පවතින පරිභෝජන මට්ටම ඉහළ යාම. (4) ජීවන තත්ත්වය ඉහළ යාම.

**1.7** සලකා බලන භාණ්ඩයේ මිල හැර එම භාණ්ඩයේ සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් කුමන හෝ සාධකයක් වෙනස්වීම හේතුකොටගෙන සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම හඳුන්වනු ලබන්නේ:

(1) සැපයුම් සංකෝචනය. (2) සැපයුම් ප්‍රසාරණය.

(3) සැපයුම අඩු වීම. (4) සැපයුම වැඩි වීම.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක නිරත ආයතනයක් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) එය දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ (normal profit) ලබයි.

(2) එය වෙළෙඳපොළ මිල තීරණය කරනු ලබයි.

(3) සමීප ආදේශක නොමැතිවීම.

(4) ආයතනය සතු නිෂ්පාදන සාධක කර්මාන්තයේ නියුතු වෙනත් ආයතනයක් වෙත පහසුවෙන් රැගෙනයාමට නොහැකි වීම.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, මුදලේ කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) වටිනාකමේ සන්නිධියක් වීම. (2) ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම.

(3) සාපේක්ෂව හිඟවීම. (4) විනිමය (ගෙවීම්) මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

**1.10** කළමනාකරුවෙකු විසින් ඔහුගේ ව්‍යාපාරයට අදාලව, පහත සඳහන් පිරිවැය හඳුනාගෙන ඇත:

| | **රු. ('000)** |
|---|---:|
| ගෙවූ වේතන | 1,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 2,500 |
| ආර්ථික ක්ෂය වීම | 500 |
| කැපකළ පොලී ආදායම | 300 |

මුළු ඍජු පිරිවැය සහ මුළු වක්‍ර පිරිවැය පිළිවෙලින්, වනුයේ *(රු.'000)*:

(1) 2,500 සහ 500. (2) 3,500 සහ 800. (3) 1,300 සහ 2,500. (4) 3,500 සහ 1,500.

*අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.11** සේවා නියුක්තිය ……………… *(සූක්ෂ්ම / සාර්ව)* ආර්ථික විද්‍යාවේ සංරචකයකි.

**1.12** පාරිභෝගික ආදායම අඩුවීම, ඉල්ලුම් වක්‍රය ……………… *(දකුණට / වමට)* විතැන්වීමට සාධකයක් වේ.

*අංක 1.13 සහ 1.14 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.13** නිමැවුමේ සමානුපාතික වැඩිවීම, යෙදවුමේ සමානුපාතික වැඩිවීමට වඩා අඩු වූ විට, වැඩිවන පරිමාණානුකූල ඵල (returns to scale) ඇතිවේ.

**1.14** ආන්තික පිරිවැය යනු අතිරේක ඒකකයක් නිපදවීමේ ප්‍රතිඵලයක් ලෙස මුළු පිරිවැයට එකතු වන අතිරේක පිරිවැය වේ.

*අංක 1.15 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.15** ආර්ථික භාණ්ඩවල ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.16** කතිපයාධිකාරි වෙළෙඳපොළක (oligopoly market) ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** රටක මුදල් සැපයුම කෙරෙහි බලපාන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

**1.18** "පටු මුදල් සැපයුම ($M_1$)" සහ "පුළුල් මුදල් සැපයුම ($M_2$)" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.19** මිල ඉල්ලුම් නම්‍යතා (price elasticity of demand) තිරක දෙකක්(02) හඳුනා දක්වන්න.

**1.20** පූර්ණ තරඟය යටතේ ආයතනයක් විසින් කෙටිකාලයේදී සමතුලිතය ළඟා කරගන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) "වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය" සහ "සැලසුම්ගත ආර්ථික ක්‍රමය" මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නේ කෙසේදැයි යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) ආර්ථික සම්පතක් වශයෙන් භූමියේ ඇති ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාවක් ලෙස සලකනු ලබන්නේ ඇයිද යන්නට හේතුව **පැහැදිලි කරන්න**. (ලකුණු 02)
(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත දී ඇති ඉල්ලුම් සමීකරණය ($Q_d$) සහ සැපයුම් සමීකරණය ($Q_s$) සළකා බලන්න:

$$Qd = 3{,}300 - 8p$$

$$Qs = -1{,}500 + 4p$$

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 03)

(ii) නිෂ්පාදකයාගේ අතිරික්තය **ගණනය කරන්න**. (ලකුණු 02)

(b) රජය මගින් කෘෂිකාර්මික භාණ්ඩයක් මත නිෂ්පාදකයින් වෙත ඒකක සහනාධාරයක් ලබාදීම මගින් ඇතිවන ප්‍රතිවිපාක ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වයට හේතු දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වය අවම කිරීම සඳහා වන පිළියම් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය බලපාන ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(a) ගෙවුම් ශේෂ ලේඛණයේ මූල්‍ය ගිණුමේ ඇතුළත් අයිතම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ආරක්ෂණවාදයට පක්ෂව සහ විපක්ෂව ඉදිරිපත් කරන තර්ක දෙක(02) බැගින් **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(c) ඇමරිකානු ඩොලරයට (US Dollar) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ආර්ථික ප්‍රතිවිපාක දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

(A) ව්‍යාපාර චක්‍රයේ (business cycle) විවිධ අවධීන් (phases) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(B) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත සපයා ඇත:

| | **රු. මිලියන** |
|---|---:|
| සේවක ආදායම | 4,200 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 3,600 |
| මිශ්‍ර ආදායම | 1,800 |
| නිෂ්පාදනය මත සහනාධාර අඩුකළ පසු වෙනත් බදු | 600 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 300 |
| නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු | 700 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ආදායම් ප්‍රවේශය (Income approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිල යටතේ දළ එකතු කළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(C) ආර්ථික ක්‍රියාවලියට දායකත්වය දෙනු ලබන සාර්ව ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(D) "සංකෝචනාත්මක පිස්කල් (රාජ්‍ය මූල්‍ය) ප්‍රතිපත්තිය (Contractionary Fiscal Policy)" සහ "ප්‍රසාරණාත්මක පිස්කල් (රාජ්‍ය මූල්‍ය) ප්‍රතිපත්තිය (Expansionary Fiscal Policy)" අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |